# දැන්වීමයි

## සුහසාධන වෛද්‍ය ක්‍රමය - 2023

## අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම ස්ථිර සාමාජික සාමාජිකාවන් වෙත.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයේ ස්ථිර සාමාජික සාමාජිකාවන් සඳහා දැනට ක්‍රියාත්මක වන සුභ සාධන වෛද්‍ය ක්‍රමය 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා පහත සඳහන් යෝජනා ක්‍රම ත්‍රිත්වය යටතේ දීර්ඝ කර ඇති බව සතුටින් දන්වමි.

| | |
|---|---|
| I යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. **2,400/-** ක මුදලක් අවුරුද්දක කාල සීමාවක් සඳහා සඳහා එකවර හෝ මාසික වාරිකය බැගින් ඔබගේ වැටුපෙන් අඩුවෙන පරිදි ගෙවිය යුතුය.(මසකට රු. **200/-**_බැගින්) |
| II යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. **7,200/-** ක මුදලක් අවුරුද්දක කාල සීමාවක් සඳහා සඳහා එකවර හෝ මාසික වාරිකය බැගින් ඔබගේ වැටුපෙන් අඩුවෙන පරිදි ගෙවිය යුතුය. (මසකට රු. **600/-**_බැගින්) |
| III යෝජනා ක්‍රමය | සාමාජිකයන් විසින් රු. **10,800/-** ක මුදලක් අවුරුද්දක කාල සීමාවක් සඳහා සඳහා එකවර හෝ මාසික වාරිකය බැගින් ඔබගේ වැටුපෙන් අඩුවෙන පරිදි ගෙවිය යුතුය. (මසකට රු. **900/-**_බැගින්) |

- 2023 සුභ සාධන වෛද්‍ය ක්‍රමයට ලියා පදිංචි වීමට බලාපොරොත්තු වන සේවක මහත්ම මහත්මීන්, දැනට ලියාපදිංචි වී සිටින යෝජනා ක්‍රමය වෙනස් කිරීමට බලාපොරොත්තු වන සාමාජික මහත්ම මහත්මීන් හා **මේ වන විටත් 2022 සුභසාධන වෛද්‍ය යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වූ සියලුම සමාජික මහත්ම මහත්මීන් ද නැවත 2023 වර්ෂ සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය වේ.**

## ලියා පදිංචි වන ආකාරය

- 2023 සුහසාධන වෛද්‍ය ක්‍රමය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ ගූගල් පෝරමය (Google form) සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය හා සේවක කටයුතු විසින් අදාල අංශයේ අංශ ප්‍රධාන වෙත විද්‍යුත් තැපැල (e mail) මගින් යොමු කර ඇත.

- අදාල අංශයේ අංශ ප්‍රධාන විසින් මෙම කටයුත්ත සාර්ථකව කිරීම සඳහා කෙනෙකු නම් කල යුතුය. අදාල නම් කල තැනැත්තා විසින් 2023 වෛද්‍ය රක්ෂණ ක්‍රමයට ලියාපදිංචි වන තම දෙපාර්තමේන්තුවේ සියලුම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගූගල් පෝරමය (Google form) 2023.02.05 දින හෝ ඊට පෙර ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය.

- **සැ.යු - 2023 සුහසාධන වෛද්‍ය ක්‍රමය සඳහා ලියාපදිංචි වීම සඳහා බලාපොරොත්තු වන නවක සමාජික මහත්ම මහත්මීන් අදාල ගූගල් පෝරමයට (Google form) අමතරව නිසි පරිදි පුරවන ලද අයදුම්පත් හා ඊට අදාල ලේඛන ද අමුණා <u>අධ්‍යයන ආයතන අංශයේ / අනධ්‍යයන ආයතන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් සහතික කර 2023.02.05 දින හෝ එදිනට පෙර ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේ සහකාර ලේඛකාධිකාරී</u> වෙත ඉදිරිපත් කළ යුතුය.**

- **අයදුම් පත්‍රය අංශ ප්‍රධාන වෙත එවනු ලබන විද්‍යුත් තැපෑලේ ද අමුණා ඇති අතර විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ද බාගත කල හැකිය.**

ලේඛකාධිකාරි
කොළඹ විශ්වවිද්‍යාලය
2023 ජනවාරි මස 05 වැනිදා